# ළමයින්ගේ ලෝකය සොයා යාම



## විජේරත්න පතිරාජ

කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපය



කතාන්දර කාලාවේ රස මිහිර පසුගිය ලිපියෙන් බැලු අපි ළමයින්ගේ ලෝකයේ එළිපත්ත සමීපයට ළඟා වීමු. එනම් ළමා වියේදී වැඩිහිටියන් විසින් ළමා-වරුන්ට පවරා දිය යුතු සම්පත් අතර දැනුම කුසලතා ආකල්ප ප්‍රවර්ධනය සඳහා කතාන්දර කලාවේ භාෂාමය දිග පළල ගැඹුර අධ්‍යයනය කළ බවය. අපගේ සා-නුකම්පිත අභියෝග හමුවේදී අපගේ ළමා පරපුරට මුහුණදීමට සිදුවන හා සිදුවියහැකි ගැටලු පිළිබඳව අධ්‍යයනය යොමු කිරීම ප්‍රමුඛ වන හෙයින් ළමයා යනු කවරෙක්ද? ඔහුට හෝ ඇයට උරුම ලෝකය කවරෙක්ද? එහි සුන්දරත්වය පුරවා ලීමට අප අතින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් කවරාකාර විය යුතුද? යන්න ගැඹුරින් සිතා බැලිය යුතුය.

සංක්‍රමණිකයන් ලෙස අප උපන් බිම හැර-දමා, වෙනත් දේශයක උරුමය වැළඳ ගැනීමට, පැමිණෙන්නේ ඇතැම් විට උපන් දා සිට මව් රටෙහි හරිහම්බ කළ සකල සම්පත් හැරදැමීමෙන් බව පිළිගත යුත්තකි. එහිදී ඇතැම්විට තම ආදරණීය මව්පියන් ප්‍රමුඛ නෑදෑ හිත මිතුරන් පමණක් නොව ඒ රටින් අපට ලබාදුන් අධ්‍යපන රැකියා ඉඩකඩම් ආදිය ද කැප කිරීමට සිදු වෙයි. එසේ කැප කරන්නේ කුමන අරමුණක් සඳහාද සෘජුව හා කෙටියෙන් පැවසුව හොත් එය මව්රටෙන් නොලැබෙන කවර හෝ නෛතික සම්පත් ආකාර සොයායාමක් බව කවුරුත් පිළිගත යුතුය. එය වඩා ප්‍රශස්ත අවධානයක් රැකියාවක් සමාජ හා-නියක් සඳහා සිහින ලොවක් සොයා යාමකි. එය ජීවිතයේ සාරවත් එගොඩක් සොයා අපේ-ක්ෂා සයුරක් තරණය කිරීමකි. විවිධ දුක්ඛ දෝමනස්සයන් හමුවේ ප්‍රකාශිත තම කුසලතාවයන් සමඟ තම අපේක්ෂාවන් ඉටු කිරීමේදී දයාර්දයතීන් මේ රටෙහි පරිපාලන ව්‍යුහය සකස් වී තිබීම ආශිර්වාදයකි. එයින් සංක්‍රමණික සංක්‍රාන්තිය සීමාසහිත මෙම අපේක්ෂාවන් ඉටු වීම පමණක් නිමවේද ? එම ගමන් මගේම අනුපූරකයන් ලෙස නව සංස්කෘතික රළගෙඩිවලට මුහුණපෑමට සිදුවන නොදරුවන්ගේ ළමා ලෝකයන්ද ඒ පිටුපස බොහෝ විට මෙරටට සංක්‍රමණය වන විට අවධානයට යොමු වූ කරුණකට වඩා මේ පරිසරයේදී මහාද්වීපික සංකෘතියේදී ජනිත වන්නකි.

ඕස්ට්‍රේලියාවේදී උපත ලබන අපගේ දරුවකු නීත්‍යානුකූලව ඕස්ට්‍රේලියානු වීම නොවැලැක්විය හැක්කකි. ශ්‍රී ලංකාවේ ඉපිද මව්පියන් සමග පැමිණි දරුවෝද පදිංචි වී පුරවැසි බව ලැබීමෙන් පසු එකී දෙමව්පියන්ද සමඟ පුරවැසි බව ලබති. නිතිය හමුවේ එසේ හැඳින්වුවත්, අප හා දූදරුවන් තුළ ශ්‍රී ලාංකිකයෙකු ජීවත් කරවීමේ අදෘශ්‍යමාන අරගලයක් මෙහිදී ඇතිවීම වැළැක්විය නොහැකිය. මන්ද යත් මේ මහද්වීපය තුළ ජීවත් වන බහුජාතික වාර්ගික සංස්කෘතිය තුළ එක් එක් ජාතීන් තම තමන්ට ආවේනික වූ සංස්කෘතිය තුළ එක් එක් ජාතීන් තම තමන්ට ආවේනික වූ සංස්කෘතික උරුමයන් සමඟ බැඳී පවතින බැවිනි. එකී අනන්‍යතාවන් ආරක්ෂා කරගැනීමට කැපවීය යුතු බැවිනි. එහෙයින් පොදුවේ ඕස්ට්‍රේලියානු භෞතිකත්වය පිළිගනිමින් එක් එක් ජාතීන්ට අනන්‍ය වූ බස - ආගම මුල්කොටගත් සංස්කෘතික උරුමයන් පවත්වාගෙන යාමට බර දැරීමට සිදුවේ. එහිදී විශේෂයෙන් ආසියාතික ජාතියක් ලෙස අධ්‍යාත්මික සැනසීම, සොම්නස හා සැහැල්ලුව ලබා ගැනීමේදී ළමා වියේ සිටම දරුවන්ට හිමි උරුමයන් ලබාදීම සැලසුම් සහිතව දියත් කළ යුත්තකි. ඒ අනුව ළමයාගේ ලෝකය හා ස්වභාවය පළමුව තේරුම් ගෙන ඉගැන්වීමක් කළ යුතුය.

ළමයා නොහොත් දරුවා යනු කවරෙක්ද යන්න ප්‍රශ්න කළහොත් ඔහු හෝ ඇය දෙමව්පියන්ගේ ආදරණීය වස්තුව යයි කිව හැකිය. උණහපුලුවාට තම පැටවා මැණිකක් යනුවෙන් හඳුන්වන්නේ දරු පැටවා කුමන තත්වයක සිටියත් මව්පිය සෙනෙහසේ උපරිමය හිමිවන සප්‍රාණය එය නිසාමය. ජීව විද්‍යාත්මක එය වැඩිහිටියන්ගේ බාලවිය නිගමන පදයකි. එය මානව සංහතියේ සුරතල්ම විය යුතු බව පැවසිය හැක. ස්-වභාව ධර්මයෙන් ළමයා වැඩිහිටියාගේ ක්ෂුද්‍ර ප්‍රාණියකු බවට පත්කර ඇතත් එය මානව බොන්සායි පැලයක් නොව අධ්‍යායනයක් කර සුරැකිය යුතු විශ්මිත ලෝකයකින් යුත් සප්‍රාණියකු බවටත් හඳුන්වා ඇත. 19 සියවසේ ඇරඹී 20 සියවසේ ළමයාගේ ශතවර්ෂය ලෙසට හැඳින්වෙන තරමේ මනෝවිද්‍යාත්මක හා අධ්‍යාපනික පර්යේෂන සිදුවන තාක් කල් දෙමව්පියන්ට පවා ළමයා හුදෙක් ක්ෂුද්‍ර ප්‍රාණියෙකු පමණක් ම විය. ඔවුන් මානව වර්ගයා අතර සුරතලයකුට වඩා සුරැකුමටකට යටත් කළ යුතු වස්තුව බවට පත්වන්නේ පළමු හා දෙවන ලෝක යුද්ධවල පරමාණු පලකර බෙ-ෝම්බ විෂෙන් විසි ලක්ෂයකටත් වඩා අහිංසක දරු පිරිසක් මිය යාමෙන් පසුවය. එය ලොව වසන යුද්ධ කළ වැඩිහිටියන් විසින් ළමා පරපුර ගැන නොසලකා කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් නිසා ඇතිකළ විනාශයක් බවට විශ්ව විමසුමට ලක්විය.

ළමයා උපත ලැබීමෙන් පසු බොහෝ විට තරුණ වයස වනතුරුම වැඩිහිටියන්ගේ ක්ෂුද්‍ර ප්‍රාණියකු බවට පත්වන්නේ වැඩිහිටි අණසක යටතේය. එය පෝෂය හා ආර-ක්ෂණය මුල් කරගෙන නිතැතින් සිදුවන්නකි. එහෙත් එය එවකට ළමයාගේ පෞරුෂ ලක්ෂණ යටපත් කරගනෙ විලංගු තරණයක් බවටව පත්වී ඇති බවත්, බොහෝ සමාජ සිද්ධීන් ක්‍රියාත්මක වීමේදී වැඩිහිටි අවශ්‍යතා හමුවේ ළමයි සිරකරුවන් බවට පත් වී ඇති බවත් විවේචනයට ලක්විය. සුරතලකු බවට පත්කර ගැනීමෙන් පමණක් ළමයාගේ භෞතික හා මානසික ලෝකයෙහි නිෂ්ටාවන් සාධනය නොව බවත් ඔවුන් පවුලකට පමණක් නොවුනු සමස්ථ ජතියක අනාගත උරුමකරුවන් වන හෙයින් විශ්ව වර්ගීකරණයකට ලක්විය යුතු බවත් මතවාද පළ කෙරුණි.

සිග්මන් ප්‍රොයිඩ්, රූසෝ, මාගරට් මීඩ්, කොල්වෙල්ඩ් කුන් බෙන්ජමින් බ්ලුම් වැනි

**ළමයා උපත ලැබීමෙන් පසු බොහෝ විට තරුණ වයස වනතුරුම වැඩිහිටියන්ගේ ක්ෂුද්‍ර ප්‍රාණියකු බවට පත්වන්නේ වැඩිහිටි අණසක යටතේය. එය පෝෂය හා ආරක්ෂණය මුල් කරගෙන නිතැතින් සිදුවන්නකි. එහෙත් එය එවකට ළමයාගේ පෞරුෂ ලක්ෂණ යටපත් කරගනෙ විලංගු තරණයක් බවටව පත්වී ඇති බවත්, බොහෝ සමාජ සිද්ධීන් ක්‍රියාත්මක වීමේදී වැඩිහිටි අවශ්‍යතා හමුවේ ළමයි සිරකරුවන් බවට පත් වී ඇති බවත් විවේචනයට ලක්විය.**

අධ්‍යපනික හා මනෝවිද්‍යාත්මක විශේෂඥයින් විසින් මෙම වකවානුවේදී හෙළි කරන ලද පර්යේෂණ ප්‍රතිඵල අනුව, ළමා ලෝකයේ ගැඹුරු සීමා නිර්ණයක් ජනිත වීමට හේතු විය. ඒ අතරින් 19 වන සියවසේදී පින් පිගරේ ඉදිරිපත් කළ ළමා සංවර්ධන අවධි පිළිබඳ දාර්ශනික මතවාදයන් අප මෙතෙක් නුදුටු ළමා ලෝකයක් පිළිබඳව සිව් වැදෑරුම් වර්ගීකරණයක් හෙළිපෙහෙළි කළේය. ඒවා නම්,

ළමයාගේ උපතේ සිට අවුරුදු 05 දක්වා
- ඉන්ද්‍රචාලක අවධිය

ළමයාගේ වයස අවුරුදු 05 සිට 07 දක්වා
- ප්‍රතිභා චින්තන අවධිය

ළමයාගේ වයස අවුරුදු 07 සිට 11 දක්වා
- සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය

ළමයාගේ වයස අවුරුදු 11 සිට 14 දක්වා
- විධිමත් චින්තන අවධිය

ළමයා යනුවෙන් හැඳින්වෙන්නේ උපතේ සිට වයස අවුරුදු 14 දක්වා කාලයක් තුළ ශාරීරික හා මානසික වශයෙන් වෙනස්වීම් අනුව ළමා ස්වභාවය හා අවශ්‍යතාවයන් කුලකවලට බෙදා මෙසේ නොකරන්නේ ඒ ඒ වයස් අනුව එතරම්ම සංකීර්ණ පවතින බැවිනි. වයස අවුරුදු 05 දක්වා වූ ළදරු හා සිඟිති වයස් කාණ්ඩය ඉන්ද්‍රිය චාලක අවධිය හෙවත් පූර්ව සංකල්ප අවධිය ලෙසද හැඳින්වේ. මන්ද ළමයාගේ බොහෝ කටයුතු මානසික පෙළඹීමකට වඩා ස්වයංක්‍රීයව දරුවා තුළ සිදුවන ලපටිවීම වයස මත බැවිනි. බොහෝ ක්‍රියාවන් සිදුවන්නේ වැරදි වැරදී හදාගන්නා තැන් වරද ක්‍රමය මගිනි. සංවේදනා ඔස්සේ ලබන ශබ්ද හා සංඥා අනුව යමක් හඳුනාගත අනුකරණය මගින් ක්‍රියාකිරීමට පෙළඹේ. ප්‍රකාශන ක්‍රියාවලිය සංඥා මගින් පමණි. දරුවකු වැඩිහිටියන්ගේ උණුසුම හා ලෝකයේ උරාගන්න පුලුවන් අවස්ථාව හෙයි න් ආදරය රැකවරණය හා පෝෂනය සමඟ වයසටය ගැළපෙන කුසලතා ආකල්ප වර්දනය කළ යුතු වේ. ළමා වයස් අවධිවල දෙවන කාණ්ඩය වන වයස 5-7 වූ ප්‍රතිභා චින්තක අවධිය දරුවකු තුළ බුද්ධිය වුවද, ලෙස වර්ධනය වන අවස්ථාවක් ලෙස සැලකේ. මනෝවිද්‍යාව අනුව ළමයා තුල වැඩිහිටි මොළයෙන් 80%ක පමණ වර්ධනයක් ඇතිවන කාලයකි. පාසල් අධ්‍යාපනයට ළමයා යොමු කරන වයසේ අවුරුදු 05ට පෙර සූදා-නමක් කිරීමට සිදුවේ. භාෂා කුසලතා ප්‍රමුඛ විවිධ හැකියාවන් සංකීර්ණ සංකල්ප ඔස්සේද ග්‍රහණය කළ යුතු ශක්තිය හා උනන්දු පවතී. කතාන්දර මාලාවේ සිද්ධානුකූල හා තාලානුකූල චලනය ප්‍රකාශනය ආදිය මගින් ද දැනුම කුසලතා හා ආකල්පද වර්ධනවයට ආරම්භ කල යුතු වකවානුවකි. සංක්‍රමික මව්පියන්ට මෙහි පවතින සංස්කෘතික ආරයන්ට අමතරව තම දේශීය උරුමයන් සිතාමතාම ලබාදීමේ උන්නදුව ඇති කළ යුතුවේ. මෙම වයසේදී ළමයා කුතුහලයෙන් ප්‍රශ්න කිරීමට, විමසා බැලීම ඔස්සේ බොහෝ දේ ප්‍රත්‍යක්ෂ කර ගනී. අනුකරණය නිරූපණය හා නිර්මාණය ඔස්සේ ඔවුන්ගේ සෙල්ලම් ලෝකයට අනුගත වූ දේශීය පරිසරයක් සකස්